සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

33 S I, II

**6 ශ්‍රේණිය** | **ඉතිහාසය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

**සැලකිය යුතුයි:**
සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. පුරාණ කාලයේ ශ්‍රී ලංකාව .............................................................................. යැයි විරුධාවලියකට හිමිකම් කීවේ සාර්ථක ලෙස ගොවිතැන් කළ නිසාය.

02. පළමුවරට රබර් බෝලයක් නිපදවන ලද්දේ .............................................................................. වැසියන් විසිනි.

03. ගිල් ගමේෂ් නැමැත්තා විසින් ලියන ලද .............................................................................. ලෝකයේ පැරණිත ම සාහිත්‍ය කෘතිය ලෙස සැළකේ.

04. ශක වර්ෂ ක්‍රමය ...................................................................... දර්ශනයකි.

05. මහසෙන් රජු විසින් ...................................................................... කරවන ලදී.

(මහා වංශය, පෙරදිග ධාන්‍යාගාරය, මෙසපොතේමියානු ශිෂ්ටාචාර, මායා ශිෂ්ටාචාර, හින්දු දින, මුස්ලිම්වරුන්ගේ දින, තිසා වැව, මින්නේරිය වැව, වීර කතාව, මුතුකැට දිවයින)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. ලෝකයේ මුලින් ම ජීවීන් බිහිවුයේ ජලයේ ය. ( )

07. මිනිසා පළමුවරට ගින්දර භාවිතා කළ බවට සාක්ෂි ඊශ්‍රායලයෙන් හමු වේ. ( )

08. දඩයම් යුගයේ මානවයා වාසය කළ ගල්ගුහා වාසස්ථානයකි පාහියන්ගල ( )

09. විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩබසින ලද්දේ මඩකලපුව ප්‍රදේශයෙනි. ( )

10. වානරයකුගෙන් මානවයකු බිහිවීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ මානව පරිනාමය යනුවෙනි. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. මෙරට ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබාගත හැකි පැරණිම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,

(1) මහාවංශය (2) දීපවංශය
(3) දළදා සිරිත (4) සද්ධර්මරත්නාවලිය

12. බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණය සිදු වූයේ,

(1) ක්‍රි. පූ. 818 (2) ක්‍රි. පූ. 544 (3) ක්‍රි. පූ, 67 (4) ක්‍රි. ව. 544

13. යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා පිහිටා ඇති ප්‍රදේශය දැන් අයත් වන්නේ,

(1) ඉරානය (2) ඉරාකය (3) ඊශ්‍රායලය (4) ඊජිප්තුව

14. පාරාවෝ රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කරන ලද්දේ,

(1) හරණි සුසාන තුළය. (2) පිරමීඩවලය.
(3) ශිලා මංජුසා තුළය. (4) මැටි ඔරු තුළය.

15. කුවේණිය අයත්වන ගෝත්‍රික ජන කොට්ඨාසය වනුයේ,

(1) දේව (2) නාග (3) ඉන්කා (4) යක්ෂ

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු දී ඇති හිස්තැන්හි ලියා දක්වන්න.**

16. මෙසපොතේමියාවේ ජීවත් වූ ........................................................................................ දක්ෂ වෙළෙන්දෝ වූහ.

17. පණ්ඩුකාභය රජතුමාගේ පියා ........................................................................................ කුමරුය.

18. මුල් වරට වී වගාව ආරම්භ වූයේ ........................................................................................ යේ ය.

19. මිනිසුන් මුලින් ම ජීවත් වූයේ ........................................................................................ වලය.

20. ගිනිකඳු පුපුරන විට පිටතට ........................................................................................ ගලා එයි.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (1) පහත දක්වා ඇති රටවල් දී ඇති සිතියමේ කුමන ඉංග්‍රීසි අක්ෂරවලින් නිරූපණය වන්නේ ද?


(i) ඉන්දියාව

(ii) චීනය

(iii) ඕස්ට්‍රේලියාව

(iv) අප්‍රිකාව

(ල. 04)





(2) (i) A රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?

(ii) මෙම සළකුණු කුමන රටකින් සොයාගනු ලැබුවේ ද?

(iii) මෙම සත්වයා ජීවත්ව ඇත්තේ කොහේ ද?

(iv) මෙම සත්වයාගේ ශරීරයේ දැකිය හැකි ලක්ෂණයක් ලියන්න.

(ල. 04)



A රූපය

(3) (i) B රූපය හඳුනාගෙන නම් කරන්න.

(ii) මෙම නිර්මාණය කුම ශිෂ්ටාචාරයකට අයත් ද?

(iii) මෙය කුමන ක්ෂේත්‍රයක් පිළිබඳව සාක්ෂි හොබවන නිමැවුමක් ද?

(iv) මෙය නිපදවීමට ගත් අමුද්‍රව්‍යයක් නම් කරන්න.

(ල. 04)



B රූපය

(4) පැරණි ශිෂ්ටාචාරය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ස්මාරකය | ශිෂ්ටාචාරය |
|---|---|
| නෙෆර්ටිටි රැජිණ | (i) ........................................ |
| ශූන්‍ය අක්ෂර | (ii) ........................................ |
| ටුටන්කාමන් රජුගේ මුහුණේ රනින් කළ අනුරුව | (iii) ........................................ |
| සත්ත්ව සංකේත සහිත මැටි මුද්‍රා | (iv) ........................................ |

(ල. 04)

02. (i) පහත මූලාශ්‍ර රචනා වූ හා ඉදි වූ කාලය ලියා දක්වන්න.

A දීපවංශය

B මහා වංශය

C පොළොන්නරුව ගල්විහාරය (ල. 03)

(ii) ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැන ගැනීමට හැකි මූලාශ්‍ර දෙකක් ලියා දක්වන්න. (ල. 04)

(iii) ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් දක්වන්න. (ල. 04)

03. (i) ගොවිතැනට යොමු වූ නව ශිලා යුගයේ මානවයා වගා කරන ලද බෝග වර්ග 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) මධ්‍ය ශිලා යුගයේ මානවයාගේ ජීවන රටාව තුළ දැකිය හැකි වෙනස්කම් හතරක් ලියන්න. (ල. 04)

(iii) පහත රූපවලින් දක්වා ඇති මානව විශේෂ හඳුනාගෙන A, B, C, D අනුපිළිවෙළට ලියා දක්වන්න.



A B C D

A - ....................................................................................................

B - ....................................................................................................

C - ....................................................................................................

D - ....................................................................................................

(ල. 04)

04. (i) මෙසොපොතේමියානු ශිෂ්ටාචාර වැසියන් පහත දෙවිවරු කුමන නම්වලින් හැඳින්වූයේ දැයි A, B, C අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - දේව මණ්ඩලයේ ප්‍රධානියා

B - පොළොවට අධිපති දෙවියා

C - සුළඟට හා ගොවිතැනට අධිපති දෙවියා (ල. 03)

(ii) මෙසොපොතේමියානු සමාජය බෙදී ගොස් තිබූ කොටස් 04 නම් කරන්න. (ල. 04)

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය අයත් වූ ප්‍රධාන නගර 04 කි. ඒ මොනවා ද? (ල. 04)

05. (i) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල මානවයා ආහාරයට ගත් ශාකමය ආහාර වර්ග 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) දඩයම් යුගයේ මානවයා මියගිය තම ඥාතීන් වෙනුවෙන් අනුගමනය කළ චාරිත්‍ර දෙකක් ලියා දක්වන්න. (ල. 04)

(iii) පහත A හා B කොටස්වලට අදාළ පිළිතුරු ලියන්න.

A විජය කුමරු හා කුවේණියගේ දරුවන් දෙදෙනා

B විජය කුමරුගේ යහළුවන් පිහිට වූ ගම්මාන දෙකක් (ල. 04)

06. (i) ඉන්දියානු සාගරයේ නැව්වලින් ගමන් කළ අය අපේ රට හැඳින්වූ වෙනත් නම් තුනක් ලියන්න. (ල. 03)

(ii) පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය ඉදි කිරීමේ දී එයට එකතු කළ අංග හතරක් නම් කරන්න. (ල. 04)

(iii) දේවානම් පියතිස්ස රජුගේ කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් දෙකක් ලියන්න. (ල. 04)

07. (i) ගොවිතැනට යොමු වූ මිනිසා විවේකය ගත කිරීම සඳහා නිරත වූ කාර්යයන් තුනක් ලියන්න. (ල. 03)

(ii) හෝමෝ සාපියන්ස් මානවයා ලෝකයේ ප්‍රදේශ ගණනාවක ව්‍යාප්තව ජීවත් වේ. ඔවුන්ගේ මුහුණේ ස්වරූපය අනුව කරනු ලබන වර්ගීකරණ හතර දක්වන්න. (ල. 04)

(iii) ශිෂ්ටාචාරයක් හඳුනාගැනීමට යොදාගත හැකි මූලික ලක්ෂණ හතරක් ලියන්න. (ල. 04)

**06 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය 2025** **ඉතිහාසය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | පෙරදිග ධාන්‍යාගාරය | 06. | ✓ | 11. | දීපවංශය | 16. | ඇසිරියන්වරු |
| 02. | මායා ශිෂ්ටාචාරය | 07. | ✓ | 12. | ක්‍රි. පූ. 544 | 17. | දීඝගාමිණී |
| 03. | වීර කතාව | 08. | ✓ | 13. | ඉරාකය | 18. | චීනය |
| 04. | හින්දු දින | 09. | × | 14. | පිරමීඩවලය | 19. | ගම්මාන |
| 05. | මින්නේරිය වැව | 10. | ✓ | 15. | යක්ෂ | 20. | ලාවා |

(2 x 20 = ල. 40)

## II කොටස

01. (1) (i) ඉන්දියාව -S (ii) චීනය - Q (iii) ඔස්ට්‍රේලියාව - P (iv) අප්‍රිකාව - R

(2) (i) ඔපබිනියාවකුගේ පාෂාණීභූත සළකුනක් (ii) කැනඩාව

(iii) මුහුදු පතුලේ (iv) ආහාර ගැනීමට මුඛයක්, ඇස් පහක්

(3) (i) කරත්තයක අනුරුවක් (ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

(iii) ප්‍රවාහන (iv) මැටි

(4) (i) ඊජිප්තු ශිෂ්ටාචාරය (ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

(iii) ඊජිප්තු ශිෂ්ටාචාරය (v) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

02. (i) A ක්‍රි. ව. හතරවන සියවස B ක්‍රි. ව. පස්වන සියවස C ක්‍රි. ව. දෙළොස්වන සියවස

(ii) ලොග් පොත, පාසලේ පැරණි ගොඩනැගිලි

(iii)
- ★ වර්තමානයේ මුහුණදෙන ගැටළු විසඳාගත හැකිය.
- ★ අනාගතය දියුණු කර ගන්නේ කෙසේ ද යන්න.
- ★ පැරණි ඇදහිලි විශ්වාස හා සංස්කෘතීන්ට ගරුකිරීමට හැකියාව ලැබීම.
- ★ ගැටළු නිරාකරණයට

03. (i) තිරිඟු, බාර්ලි, වී, කුරක්කන්

(ii)
- ★ දිගු කාලයක් එකතැනක ජීවත් වීම.
- ★ වර්ණ භාවිත කරමින් ගල්පර්වත මත චිත්‍ර ඇඳීම.
- ★ නිවාස තනා ගැනීම.
- ★ දඩයමින් ආහාර රැස් කිරීම.
- ★ දුනු ඊතල භාවිතය.

(iii) A. ඔස්ට්‍රලොපිතිකස් B. හෝමෝ ඉරෙක්ටස්

C. හෝමෝ සාපියන්ස් D. හෝමෝ හැබිලිස්

04. (i) A - අනු B - එන්කිකි C - එන්ලිලි

(ii) පූජකයින්, ඉහළ පන්තිවලට අයත් වැසියන්, පහළ පන්තිවලට අයත් වැසියන්, වහලුන්

(iii) මොහෙන්ජොදාරෝ, හරප්පා, ධොලවීර, කාලිබන්ගන්

05. (i) වල්දෙල්, වල් කෙසෙල්, කටු අල

(ii) වකුටුකොට වැළලීම. / ඇටසැකිලිවල රතුපාට ආලේප කිරීම.

(iii) A - ජීවහත්ථ, දිසාල B - උපතිස්සගාම, අනුරාධගාම, දීඝායුගම

06. (i) සීහලදීප, සිලෙදිබා, සෙයිලාන්, සෙරන්ඩිබ්, තැප්‍රොබේන්

(ii) දිය අගලක් / නගරයට ඇතුළු වීමට ප්‍රධාන දිශා හතරට / දොරටු හතරක් / මාර්ග පද්ධති / උද්‍යාන / පොකුණු

(iii)
- ★ මිහිඳු මහ රහතන් වහන්සේ බුදු දහම මෙරටට ගෙන ඒම.
- ★ සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය රැගෙන ඒම.
- ★ ථූපාරාමය ඉදිවීම.

07. (i) චිත්‍ර ඇඳීම. / පිළිම සෑදීම. / සංගීතයට යොමු වීම.

(ii) කොකොසයිඩ් / නිග්‍රොයිඩ් / ඔස්ට්‍රලොයිඩ් / මොන්ගොලොයිඩ්

(iv) අකුරු ලිවීමට හුරු කිරීම. / නගර පාලනය කිරීම. /ආගමික ස්ථාන ඉදිකිරීම. / දුරු රටවල් සමඟ වෙළඳාම් කිරීම.